# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ
***

## <u>මාධ්‍ය ප්‍රකාශකතුමා විසින් නිකුත් කරන ලද ප්‍රකාශය</u>

*ඉන්දියාව විසින් තවදුරටත් මූල් ය සහයෝගය ලබා නොදෙන බවට පළවූ වාර්තා සම්බන්ධයෙන් වන මාධ් ය විමසුම්වලට ප් රතිචාර වශයෙන් මාධ් ය ප් රකාශකතුමා විසින් නිකුත් කරන ලද ප් රකාශය*

උක්ත කරුණ සම්බන්ධයෙන් වන මාධ් ය වාර්තා අපි දුටුවෙමු. ශ් රී ලාංකික ජනතාව විසින් මුහුණ දෙන දුෂ්කරතා ම හරවා ගැනීම සඳහා ඉන්දියාව විසින් ශ් රී ලංකාවට මෙම වසරේදී  මරිකානු ඩොලර් බිලියන 4කට  සන්න ද්විපාර්ශවික සහයෝගයක් ලබා දී  ති බව මෙහි ලා අපි අවධාරණය කිරීමට කැමැත්තෙමු. එය පෙර නොවූ විරූ සහයෝගයකි.

එසේම, ඉන්දියාව කඩිනමින් වර්තමාන  ර්ථික දුෂ්කරතා සමනය කිරීම සඳහා ශ් රී ලංකාවට සහය දෙමින් අනෙකුත් ද්විපාර්ශවික සහ බහුපාර්ශවික සහකරුවන් සම  ද ශ් රී ලංකාවට පක්ෂව කටයුතු කර  ත. ජාත් යන්තර මූල් ය අරමුදල සහ ශ් රී ලංකා රජය අතර කාර්ය මණ්ඩල මට්ටමේ එක තාවයක්  තිකර ගත් බව ද අපි දුටුවෙමු. එහි ඉදිරි එක තාවයන් ශ් රී ලංකාවේ ණය තිරසාරභාවය  තුළු කරණු මත තීරණය වනු  ත. කඩිනමින් ශ් රී ලංකා  ර්ථිකය යථා තත්වයට පත් කිරීම සහ  ර්ථික වර්ධනය ළ  කර ගැනීම උදෙසා අපි විශේෂයෙන්ම ශ් රී ලංකාවේ ප් රධාන  ර්ථික ක්ෂේත් රයන්හි දිගු කාලීන ඉන්දියානු  යෝජන ප් රවර්ධනය කිරීම  තුළු හැකි සෑම අයුරකින්ම තවදුරටත් ශ් රී ලංකාවට සහයෝගය ලබා දෙන්නෙමු.

මෙයට අමතරව, ශ් රී ලංකාව තුළ අපගේ ද්විපාර්ශවික සහයෝගීතා ව් යාපෘතීන් රැසක් ද ක් රියාත්මක අතර  වායේ සමස්ත වටිනාකම  මරිකානු ඩොලර් බිලියන 3.5ක් පමණ වේ. ශ් රී ලාංකිකයන්ට ප් රමුඛ පෙළේ ඉන්දියානු  යතනයන්හි උසස් අධ් යාපනය හැදෑරීම සහ කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා ශිෂ් යත්ව ද පිරිනැමේ. ශ් රී ලංකාව සම   පවතින අපගේ සමීප සහ දිගුකාලීන සහයෝගීතාවයේ මෙවෙන් පැතිකඩ ද ශ් රී ලංකාවේ වර්තමාන  ර්ථික දුෂ්කරතා ජයගැනීම සඳහා දායකත්වය ලබා දෙයි.

***

**කොළඹ**
2022 සැප්තැම්බර් 20